# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No } 10120

ෆැක්ස්
தொலைநகல
Fax } 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone } 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site } www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail } dir.media@police.gov.lk


---

මගේ අංකය
எனது இலக்கம்
My NO } 2014/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No } / 2024

දිනය
திக
Date } 23/07/2024
පැය 1305

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයක් - කුරුඳුවත්ත පොලිස් වසම.

2024.07.23 වන දින අළුයම් කාලයේ කුරුඳුවත්ත පොලිස් වසමේ වෝඩ් පෙදෙසේ ත්‍රී රෝද රථයක් තුල තියුණු ආයුධයකින් පහර දී පුද්ගලයෙකු ඝාතනය කර ඇති බවට කුරුඳුවත්ත පොලිසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 33 ක් වන බලවින්න, ගොඩකවෙල ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකි.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ පොලිස් මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත.

ඝාතනය සිදු කරන ලද සැකකරුවන් මෙතෙක් අනවරණය කරගෙන නොමැති අතර සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා කුරුඳුවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. මනුෂ්‍ය ඝාතනයක් සඳහා අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - උප්පුවේලි පොලිස් වසම.

2024.07.13 වන දින උප්පුවේලි පොලිස් ස්ථානයට වාර්තා වූ ඇලස්වත්ත, ත්‍රිකුණාමලය ප්‍රදේශයේ පදිංචි වයස අවුරුදු 41 ක් වන පුද්ගලයෙකු සහ කැබ් රථයක් පැහැරගෙන ගොස් එම පුද්ගලයාව ඝාතනය කර කැබ් රථය තුළට දමා ගිනි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීම සම්බන්ධයෙන් උප්පුවේලි පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් විමර්ශනයක් ආරම්භ කරන ලදි.

ඒ අනුව සිදුකරන ලද විමර්ශනයේදී 2024.07.24 වන දින උදෑසන කාලයේ උප්පුවේලි පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් මෙම මනුෂ්‍ය ඝාතනයේ ප්‍රධාන සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24ක් වූ ආනන්දපුරි, ත්‍රිකුණාමලය ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකි.**

උප්පුවේලි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මාරක රිය අනතුරක් - රක්වාන පොලිස් වසම.**

2024.07.23 වන දින අළුයම් කාලයේ රක්වාන පොලිස් වසමේ රක්වාන ගොඩකවෙල මාර්ගයේ මස්ඉඹුල ප්‍රෙද්ශයේ අතුරුමාර්ගයක ගමන්ගත් යතුරු පැදියක් තේ ඉඩමකට පෙරළී ගොස් අනතුරක් සිදුව ඇත. අනතුරින් පසුපැදිකරු බරපතල තුවාල ලබා කහවත්ත රෝහලට ඇතුලත් කිරීමට රැගෙන යන අවස්ථාවේදී මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 47 ක් වන මස්ඉඹුල, ගොඩකවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කහවත්ත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. රක්වාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**